# ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

## මාර්ගගත කෙටිකාලීන භාෂා පාඨමාලා - 2023

ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ භාෂා අධ්‍යයන පීඨය මඟින් පවත්වනු ලබන මාර්ගගත (Online) කෙටිකාලීන භාෂා පාඨමාලා සඳහා 2023 ජනවාරි මස 01 දින සිට 2023 ජනවාරි මස 31 දින දක්වා ලියාපදිංචි වීමට කැමති අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01 පාලි, සංස්කෘත, සිංහල, ඉංග්‍රීසි, දෙමළ, චීන, ජපන්, කොරියන්, ප්‍රංශ සහ හින්දි භාෂාවලට අදාළ ප්‍රාරම්භක කෙටිකාලීන පාඨමාලා .

**ඇතුළත් වීමේ සුදුසුකම්:**

- මෙම භාෂා පාඨමාලා ඉලක්ක කර ඇත්තේ භාෂාව පිළිබඳ කිසිදු දැනුමක් නොමැති එහෙත් ඒ සඳහා උනන්දුවක් දක්වන අපේක්ෂකයන් උදෙසා වන බැවින් වයස අවුරුදු 16 සම්පූර්ණ වීම හැර වෙනත් කිසිදු පූර්ව සුදුසුකමක් අවශ්‍ය නොවේ.

**පාඨමාලා කාලය :**

පාඨමාලා කාලය මාස 6 ක් වන අතර සතියකට පැය දෙකක් මාර්ගගත දේශන පැවැත්වේ. (මුළු පැය ගණන 120 කි.)

**මාධ්‍යය -**

සියලු ම භාෂා පාඨමාලා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වෙන අතර පාලි සහ සංස්කෘත භාෂා පාඨමාලා සිංහල මාධ්‍යයෙන්ද පැවැත්වේ.

**අයදුම්පත්‍ර ගාස්තුව :** රු. 500/- කි

**පාඨමාලා ගාස්තු :**

එක් භාෂා පාඨමාලාවක් සඳහා අයකරන මුළු ගාස්තුව රු. 10,000/- කි. (එය ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ ගිණුමට 711202 බැර කොට අදාළ රිසිට් පත අයදුම්පත සමඟ යොමු කළ යුතුය.)

**පාඨමාලා ආරම්භය හා ඉගැන්වීම් ක්‍රමවේදය :**

සියලු පාඨමාලා 2023 පෙබරවාරි 27 ආරම්භ කරන අතර මාර්ගගත ක්‍රමයට විවිධ තාක්ෂණික මෙවලම් යොදාගනිමින් කණ්ඩායම් ක්‍රියාකාරකම්, ප්‍රස්තුතීකරණ, ශ්‍රව්‍ය හා දෘෂ්‍ය ආධාරක ආදිය ඇසුරින් ආකර්ෂණීය ලෙස දේශන පැවැත්වේ.

**අයදුම්පත් ලබා ගත හැකි ආකාරය :**

**වෙබ් අඩවිය මගින්**

අයදුම්පත් ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ වෙබ් පිටුවට (www.bpu.ac.lk ) පිවිස බාගත කර ගත හැකිය. දිවයිනේ ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් හෝමාගම ලංකා බැංකු ශාඛාවේ ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ ගිණුම් අංක **711202** දරණ ගිණුමට බැර වන පරිදි අයදුම්පත් ගාස්තුව වන රු. 500/- සහ පාඨමාලා ගාස්තුව වන රු. 10,000/- ක මුදල ගෙවා ලබා ගන්නා ලද ලදුපත අයදුම් පතට අමුණා එවිය යුතුය.

**තැපැල් මගින්**

තැපැල් මගින් අයදුම්පත් ලබා ගැනීමට අපේක්ෂා කරන්නේ නම් දිවයිනේ ඕනෑ ම ලංකා බැංකු ශාඛාවකින් හෝමාගම ලංකා බැංකු ශාඛාවේ ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ ගිණුම් අංක **711202**, දරණ ගිණුමට බැර වන පරිදි **රු. 500/-** ක් ගෙවා ලබා ගන්නා ලද ලදුපත සමග නම, ලිපිනය ලියන ලද 9''x4'' ප්‍රමාණයේ රු. 15/-ක මුද්දර ඇලවූ කවරයක් පහත සඳහන් ලිපිනයට 2023.01.16 දිනට පෙර ලැබෙන සේ එවිය යුතුය. **චෙක්පත් හෝ තැපැල් ඇණවුම් භාර ගනු නොලැබේ.** අයදුම්පත් ලබා ගැනීම සඳහා එවනු ලබන කවරයේ වම් පස ඉහළ කෙළවරේ **"කෙටිකාලීන භාෂා පාඨමාලා සඳහා අයදුම්පත්‍රය "** යනුවෙන් සඳහන් කළ යුතු ය.

අයදුම්පත් ලබා ගැනීමේ දී ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් හෝමාගම ලංකා බැංකු ශාඛාවේ ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ ගිණුම් අංක **711202**, දරණ ගිණුමට බැර වන පරිදි රු.500/- ක් ගෙවා ලබා ගන්නා ලද ලදුපත ඉදිරිපත් කිරීමෙන් හෝ විශ්වවිද්‍යාලයේ සරප් කවුළුවට රු.500/- මුදල ගෙවීමෙන් ලබා ගන්නා ලද ලදුපත සමඟ ඉදිරිපත් කළ යුතුය.

සම්පූර්ණ කරණ ලද අයදුම්පත් සහ ගෙවන ලද ලදුපත් පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් 2023.01.31 දිනට හෝ එදිනට පෙර ලැබෙන සේ එවිය යුතුය.

සහකාර ලේඛකාධිකාරී
පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය හා බාහිර විභාග මධ්‍යස්ථානය,
ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය,
214, බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2023.01.31 වේ. අයදුම්පත් තැපැල් මඟින් එවන්නේ නම් ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතු ය. **අසම්පූර්ණ අයදුම්පත් හා අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයෙන් පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

**දුරකථන අංක : 011-2580609 / 011-2502944 / 0777899503**

ලේඛකාධිකාරී
ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය.
214 බෞද්ධාලෝක මාවත, කොළඹ 07
2022.11.02